ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී
ගෞරව උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNE5247/ESE5147-අන්තර්කරණ පන්තිකාමරවල ළමයින්ගේ ගැටළු සමඟ කටයුතු කිරීම**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.02.02 | වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද , 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>01 වන කොටස</u>

01. අන්තර්කරණ අධ්‍යාපන භාවිතයන් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ පාසල් වලට මුහුණදීමට සිදුවන ප්‍රධාන බාධක පහක් (05) හඳුනාගෙන විස්තර කරන්න.

02. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ අන්තර්කරණ අධ්‍යාපනයට දෙමාපිය මැදිහත්වීමෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් (02) සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

03. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හුදකලාවීම වැළැක්වීමට පාසල්වලට අනුගමනය කළහැකි උපාය මාර්ග දෙකක් (02) ලැයිස්තුගත කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

04. දුබලතාව පිළිබඳ වෛද්‍යමය සහ සමාජමය ආකෘතීන් වෙන්කර හඳුනාගන්න.

05. සිසුන්ගේ ඉගෙනුම් විවිධත්වයට ආමන්ත්‍රණය කිරීමේදී පහසුකම් සපයන්නෙකු ලෙස ගුරුවරයෙකුගේ බහුවිධ කාර්යභාරය පැහැදිලි කරන්න.

06. "බහු ශික්ෂණ කණ්ඩායම" යන යෙදුම නිර්වචනය කර එහි සිටින ප්‍රධාන වෘත්තිකයන් තිදෙනෙකු (03) සඳහන් කරන්න.

07. අන්තර්කරණ අධ්‍යාපනඥයෙකු තුල තිබිය යුතු සාධනීය ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

08. ආබාධ සහිත සිසුන් අවම බාධා සහිත පරිසරයක තබා ගැනීමේ සුවිශේෂී ප්‍රතිලාභ තුනක් ලැයිස්තුගතකර, මෙම අන්තර්කරණ ප්‍රවේශය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීමේදී පාසල් මුහුණ දෙන ප්‍රධාන අභියෝග දෙකක් (02) සාකච්ඡා කරන්න.

(ලකුණු 05x08=40)



115

## 02 කොටස

09. **"සංවර්ධනය වෙමින් පවතින රටවල සිටින අබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැත."**

(i.) සංවර්ධනය වෙමින් පවතින රටවල, අබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනයට ප්‍රමුඛත්වයක් දීමට බාධා කරන කරුණු පහක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(ii.) ආබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනය අඛණ්ඩවම නොලසකා හැරියහොත් එමගින් සමාජයට ඇතිවිය හැකි දිගුකාලීන ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) ආබාධ සහිත දරුවන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයකට ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා රජයට ගතහැකි උපාය මාර්ග තුනක් **(03)** සඳහන් කර ඒවා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 09)

10. (i.) විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනයට දෙමාපියන් සම්බන්ධකරගත හැකි ක්‍රම තුනක් **(03)** ලැයිස්තුගත කර ඒ සෑම කරුණක්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) ආබාධ සහිත දරුවන්ගේ සාර්ථකත්වයට දෙමාපියන්ගේ ආකල්ප සහ හැගීම් බලපාන ආකාරය උදාහරණ තුනක් **(03)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) "දෙමාපිය සහායක කණ්ඩායම් යනු එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට සහ අත්දැකීම් බෙදාගැනීම සඳහා වටිනා වේදිකාවකි." මෙම ප්‍රකාශය විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

11. **"විශේෂ අධ්‍යාපන ගුරුවරුන්, සාමාන්‍ය අධ්‍යාපන ගුරුවරුන්ට වඩා දැනුම, කුසලතා සහ ආකල්ප වලින් සන්නද්ධ විය යුතුය."**

(i.) සාමාන්‍ය අධ්‍යාපන ගුරුවරුන්ට සාපේක්ෂව විශේෂ අධයාපන ගුරුවරුන්ට තිබිය යුතු දැනුම සහ කුසලතා මොනවාද? (ලකුණු 05)

(ii.) උදාහරණ තුනක් **(03)** උපුටා දක්වමින් විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ගේ ආකල්ප වල වැදගත්කම සහ ආබාධ සහිත සිසුන්ගේ ඉගෙනුම් පරිසරයට මෙම ආකල්ප බලපාන ආකාරය අගයන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධන සැලැස්මක් සැලසුම් කිරීමට ඔබට අවස්ථාව ලැබී ඇතැයි උපකල්පනය කරන්න. ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා එම සැලැස්මට ඇතුලත් කළයුතු විශේෂිත ක්ෂේත්‍ර මොනවාද? (ලකුණු 09)



116

12. (i.) අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේදී පාසල් මට්ටමින් මුහුණ දෙන අභියෝග **පහක් (05)** ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(ii.) "සම වයසේ මිතුරන්ගේ සහයෝගය සහ ආකල්ප අන්තර්කරණයෙහි සාර්ථකත්වයට බෙහෙවින් දායක වේ." උදාහරණ තුනක් **(03)** ඇසුරින් මෙම ප්‍රකාශය විමසා බලන්න. (ලකුනු 07)

(iii.) අන්තර්කරණයෙහි සාර්ථකත්වය වැඩිදියුණු කිරීමට ආබාධ සහිත සිසුන් කෙරෙහි සම වයස් මිතුරන් අතර ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීමෙහිලා පාසල් මට්ටමින් සිදුකළහැකි ක්‍රියාමාර්ග **හතරක් (04)** යෝජනා කරන්න. (ලකුණු 08)

13. (i.) විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා පුද්ගල බද්ධ අධ්‍යාපන සැලැස්මක් (IEP) තිබීමේ වැදගත්කම කරුණු **පහක් (05)** ඇසුරින් සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ ආබාධ සහිත සිසුන් සඳහා පුද්ගල බද්ධ අධ්‍යාපන සැලසුම් (IEP) සකස් කිරීමේදී මතුවිය හැකි අභියෝග තුනක් උපුටා දක්වන්න. (ලකුණු 07)

(iii.) ඉහත සඳහන් අභියෝග ජය ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

14. (i.) විශේෂ අවශ්‍යතා සහිත සිසුන් තුලින් දක්නට ලැබෙන අභියෝගාත්මක හැසිරීම් **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) ඉහත ඔබ සඳහන් කළ චර්යාත්මක ගැටලු අතරින් දෙකක් **(02)** තෝරාගෙන පංතිකාමරය තුල එවැනි හැසිරීම් කළමනාකරණය කිරීමට ඔබ භාවිත කරන උපායමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) චර්යාත්මක ගැටලු සහිත දරුවන්ගේ අභියෝගාත්මක හැසිරීම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීමේදි ගුරුවරුන්, දෙමාපියන් සහ සහායක කාර්යය මණ්ඩලය අතර, සහයෝගිතාවයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 07)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



117